# දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

# එකතුකළ අගය මත බද්ද

**2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතට සඳහා කෙරෙන සංශෝධන**

2011 අයවැයෙන් ප්‍රකාශයට පත් කළ පරිදි එකතු කළ අගය මත බදු විධි විධාන සඳහා වන පහත සඳහන් සංශෝධන, 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතට විධිමත් සංශෝධන කිරීමට යටත්ව (වෙනත් ආකාරයකින් සඳහන් කර නොමැති නම්), 2011.01.01 දින සිට ක්‍රියාත්මක වන බව බදු ගෙවන්නන් වෙත දැනුම් දනු ලැබේ.

1. **20% ක් වූ එකතු කළ අගය මත බදු අනුප්‍රමාණය 12% දක්වා අඩු කිරීම.**

(අ) එකතු කළ අගය මත බදු පනතෙහි **4 වන උපලේඛනයෙහි** නිශ්චිතව දක්වා ඇති භාණ්ඩ ආනයනය හෝ සැපයීම සම්බන්ධයෙන් එකතු කළ අගය මත බදු අනුප්‍රමාණය 20% සිට 12% දක්වා අඩු කිරීම, **2010.11.23 දින සිට** ක්‍රියාත්මකව පවතී.

(ආ) පහත සඳහන් සේවාවන් සැපයීම සම්බන්ධයෙන් එකතු කළ අගය මත බදු අනුප්‍රමාණය 20% සිට 12% දක්වා අඩු කිරීම, **2011.01.01 දින සිට** ක්‍රියාත්මක වනු ඇත.

- වෘත්තිකයන්ගේ සම්මේලන, සම්මන්ත්‍රණ හෝ ඒ හා සමාන කටයුතු සඳහා හැර විවාහ මංගල උත්සව පැවැත්වීම සහ වෙනත් සම්භාෂණ පැවැත්වීම සහ එම විවාහ මංගල උත්සව හා වෙනත් සම්භාෂණ සඳහා ශාලා කුලියට දීමද ඇතුලත්ව, **හෝටල්, ආගන්තුක නිවාස, ආපන ශාලා හෝ ඒ හා සමාන ආයතන විසින් සේවා සැපයීම ;** සහ

- එකතු කළ අගය මත බදු පනතෙහි **III (අ) පරිච්ඡේදයෙහි** සඳහන් **මූල්‍ය සේවාවන්.**

  (මෙම මූල්‍ය සේවා පිළිබඳ එකතු කළ අගය මත බද්ධ සඳහා ලාභය ගණනය කිරීමේදී එකී එකතු කළ අගය මත බදු ද අඩු කරනු ලැබිය හැකිය).

2. **වෛකල්පිත එකතු කළ අගය මත බද්ද ගෙවීම සඳහා (නිශ්චිත කාල සීමා මත පදනම් වූ) අනුප්‍රමාණ උප ලේඛනයක් හඳුන්වා දීම.**

වෛකල්පිත එකතු කළ අගය මත බද්ද සඳහා ලියාපදිංචි වන දිනට පසුව එළඹෙන (නිශ්චිත) කාල සීමා සමග පමණක් වෙනස් වන අනුප්‍රමාණයක් සහිත පහත සඳහන් අනුප්‍රමාණ උපලේඛනය, නව සහ දැනට ඒ සඳහා ලියාපදිංචි වී සිටින වෛකල්පිත එකතු කළ අගය මත බදු ගෙවන්නන් සඳහා 2011.01.01 දින සිට ක්‍රියාත්මකය.

වෛකල්පිත එකතු කළ අගය මත බදු ගෙවීම සඳහා තීරණය කොට ලියාපදිංචි වී ඇති ඕනෑම තැනැත්තෙකුට එකී ක්‍රමය තුල සිටින අතර පිරිවැටුම උපරිම සීමාව ඉක්මවා ගියද, කාල පරිච්ඡේදය පුරාම එකී ක්‍රමය තුලම රැඳී සිටිය හැකිය.

| **කාල සීමාව** | **අනුප්‍රමාණය** |
|---|---|
| 1.) ලියාපදිංචි වූ දින සිට පළමු වර්ෂ 3 | 2% |
| 2.) ඊලඟ වසර 3 | 4% |
| 3.) ඊලඟ වසර 3 | 8% |
| 4.) ඊලඟ වසර 3 | 12% |

3. **නිදහස් කිරීම් උපලේඛනයට එකතු කිරීම්.**

(අ) පහත සඳහන් භාණ්ඩ **ආනයනය කිරීම සහ සැපයීම** නිදහස් වීම 2010.11.26 **දින සිට** ක්‍රියාත්මකය.

- සංයෝජිත වර්ගීකරණ අංක 2710.11.20 යටතේ දක්වා ඇති පෙට්‍රල් ;
- සංයෝජිත වර්ගීකරණ අංක 2701.11, 2701.12 සහ 2701.19 යටතේ දක්වා ඇති ගල් අඟුරු ; සහ
- සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ 27.14 සහ සංයෝජිත වර්ගීකරණ අංක 2713.20 යටතේ දක්වා ඇති බිටුමින් (තාර).

(ආ) සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ 8437.10, 8437.80 සහ 8428.90 යටතේ දක්වා ඇති ධාන්‍ය මිශ්‍ර බේකරි නිෂ්පාදන නිපදවීම සඳහා යොදා ගන්නා යන්ත්‍ර සහ උපකරණ **ආනයනය සහ සැපයීම** නිදහස් කිරීම, 2010.11.29 **දින සිට** ක්‍රියාත්මකය.

(ඇ) පහත සඳහන් සේවාවන් **සැපයීම** නිදහස් කිරීම, 2011.01.01 **දින සිට** ක්‍රියාත්මක වේ.

- විදුලි සංදේශ සේවා ;

  කාබනික අපද්‍රව්‍ය භාවිතා කර දේශීයව සම්පීඩනය කර කුට්ටි කර ගත් ගල් අඟුරු (briquettes and pallets) නිෂ්පාදනය කිරීම ;

- මුදල් අමාත්‍යවරයා විසින් අනුමත කරන ලදුව, රජයේ අමාත්‍යාංශ සඳහා සෘජුවම සිදු කෙරෙන විදේශ ණය හෝ පරිත්‍යාග මගින් අරමුදල් සැපයෙන යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතියකට සපයනු ලබන භාණ්ඩ හෝ සේවාවන් ;
- ආබාධිත රණවිරුවන් පුනරුත්ථාපනය කිරීමේ කාර්යය සඳහා ආරක්ෂක අමාත්‍යාංශය විසින් පිහිටුවනු ලැබුවා වූද, එහි කාර්යයන් එම රණවිරුවන් විසින් කරනු ලබන්නා වූද, ආයතනයක් විසින් සපයන භාණ්ඩ හෝ සේවා ;
- දේශීයව සකසන ලද පරිගණක මෘදුකාංග ;
- රක්ෂණ ව්‍යාපාරයක, යම් දේශීය රක්ෂණ සමාගමක් විසින් ලබන ප්‍රතිරක්ෂණ කොමිස් හෝ වන්දි ලැබීම් වන්නා වූ සේවා ලැබීම් ;
- විදුලි සංදේශන නියාමන කොමිෂම විසින් දේශීය විදුලි සංදේශ නියාමකවරුන් සඳහා නිකුත් කරනු ලබන බලපත්‍ර මත අදාල සේවාවන් ;
- අධ්‍යාපන සේවාවන් ; සහ
  - පොදු මගී ප්‍රවාහනය සඳහා යොදා ගන්නා මගී ආසන 28 කට නොඅඩු මෝටර් කෝච් රථ ;
  - ලොරි; සහ
  - ට්‍රැක්ටර්

  සඳහා කල්බදු පහසුකම් සැපයීම ;

(ඈ) පහත සඳහන් භාණ්ඩ **ආනයනය සහ සැපයීම** සඳහා වූ නිදහස් කිරීම 2011.01.01 **දින සිට** ක්‍රියාත්මක වනු ඇත.

- සංයෝජිත වර්ගීකරණ අංක 8453.10, 8453.20 සහ 8453.80 යටතේ වර්ගීකරණය කර ඇති සම් හෝ පාවහන් කර්මාන්ත සඳහා යොදා ගන්නා යන්ත්‍ර සහ උපකරණ ;
- සංයෝජිත වර්ගීකරණ අංක 8479.89.10 සහ සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ 90.01 සිට 90.33 දක්වා වර්ගීකරණය කර ඇති උසස් තාක්ෂණයෙන් යුත් වෛද්‍ය සහ විද්‍යාගාර උපකරණ ;
- සංයෝජිත වර්ගීකරණ අංක 9029.10.10 යටතේ වර්ගීකරණය කර ඇති කුලී රථ මීටර් ;
- සංයෝජිත වර්ගීකරණ අංක 7309.00.10, 8479.89.30, 7308.90.10, 8479.89.40, 8433.11, 8433.19 සහ 8433.90 යටතේ වර්ගීකරණය කර ඇති කෘෂිකාර්මික යන්ත්‍ර සූත්‍ර සහ කොටස්.
- සංයෝජිත වර්ගීකරණ අංක 8414.51, 8516.32, 8516.33, 8516.50, 8516.60.10, 8516.90.10, 8516.71, 8516.72, 8516.79.20, 8517.11, 8521.10, 8521.90, 8527.91, 8527.92, 8528.72.41, 8528.72.91, 9101.91, 9101.99, 9105.11, 9105.19, 9105.21, 9105.29, 9105.91, 9105.99, සහ 9207.10 යටතේ වර්ගීකරණය කර ඇති විද්‍යුත් උපකරණ ; සහ
- සංයෝජිත වර්ගීකරණ අංක 3926.90.70, 7018.10 සහ සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ 28.43, 71.13, 71.14, 71.15, 71.16 සහ 71.17 යටතේ වර්ගීකරණය කර ඇති කෘත්‍රිම ස්වර්ණාභරණ නිෂ්පාදනය සඳහා යොදා ගන්නා ද්‍රව්‍ය (භාණ්ඩ).

(ඉ) පහත සඳහන් භාණ්ඩ **ආනයනය** කිරීම සම්බන්ධයෙන් වූ නිදහස් කිරීම 2011.01.01 **දින සිට** ක්‍රියාත්මක වේ.

- මුදල් අමාත්‍යවරයා විසින් අනුමත කරන ලදුව, රජයේ අමාත්‍යාංශවලට ලැබෙන විදේශ අරමුදල් හෝ පරිත්‍යාග මත සිදු කරනු ලබන ඕනෑම යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතියකට භාණ්ඩ ;
- සංයෝජිත වර්ගීකරණ අංක 8443.32.40, 8517.12.90, 8517.18, 8517.61, 8517.62.10, 8517.62.90, 8517.69, 8517.70, 8523.52, 8536.69.10, 8536.69.90, 8536.90.10, 8536.90.90, 8544.11.90, 8544.19, 8544.70 යටතේ වර්ගීකරණ කර ඇති විදුලි සංදේශන කර්මාන්තය සඳහා යොදා ගනු ලබන යන්ත්‍ර සහ උසස් තාක්ෂණයෙන් යුතු උපකරණ ; සහ
- සංයෝජිත වර්ගීකරණ අංක 8805.21 සහ 8805.29 යටතේ වර්ගීකරණය කර ඇති ගුවන් යානා සමමිතිකයන් සහ අමතර කොටස්.

**4. එකතු කළ අගය මත යෙදවුම් බදු බැර අඩු කිරීම සම්බන්ධ සීමා කිරීම් ලිහිල් කිරීම.**

එකතු කළ අගය මත බදු යෙදවුම් බදු බැර අඩු කිරීම මත දැනට පවතින සීමාව වන " එකතු කළ අගය මත නිමැවුම් බදුවලින් 85% " යන්න **" එකතු කළ අගය මත නිමැවුම් බදුවලින් 100%"** දක්වා ලිහිල් කිරීම 2011.01.01 දින හෝ එදිනට පසුව යම් බදු ඉන්වොයිසියක් හෝ රේගු ප්‍රකාශනයක් මගින් කරනු ලබන ඕනෑම වලංගු ඉල්ලීමකට අදාල වේ.

2010.12.31 දිනට අඩු නොකොට ඉතිරිව ඇති යම් යෙදවුම් බද්දක් වේ නම් එය පහත සීමාවන්ට යටත්ව 2011.01.01 දින හෝ එදිනට පසුව ආරම්භ වන බදු අය කළ හැකි එක් එක් කාල පරිච්ඡේදවල එකතු කළ අගය මත බද්ද සඳහා වූ නිමැවුම් බදුවලින් අඩු කරනු ලැබිය හැක.

- එකතු කළ අගය මත බදු පනතේ අදාල විධි විධානවලට යටත්ව ගණනය කරන ලද 2010.12.31 දිනට අඩු නොකරන ලද එකතු කළ අගය මත බද්දේ මුළු යෙදවුම් බදු අගයෙන් 10% ක සීමාවට යටත්ව ; සහ
- 2010.12.31 දිනට පසුව වන අනෙකුත් යෙදවුම් බද්ද ඇතුළුව නිමැවුම් බද්දෙන් 100% ක් නොඉක්මවන අයුරු.

2010.12.31 දිනට පසුව වන සැපයුම්, එකතු කළ අගය මත බද්දෙන් නිදහස් වන්නේ නම් හෝ වෙනත් යම් හේතුවක් නිසා එකතු කළ අගය මත බදු ගෙවීමට යටත් නොවන්නේ නම් එසේ අඩු නොකරන ලද එකතු කළ අගය මත යෙදවුම් බදු බැර, දේශීය ආදායම් පනතෙහි විධි විධාන යටතේ ආදායම් බදු කාර්යයන් සඳහා ලාභ / අලාභ ගණනය කිරීමේදී, වියදමක් ලෙස අඩු කරනු ලැබිය හැකිය.

**5. වාර්තා ඉදිරිපත් කිරීමේ කාල සීමාව වෙනස් කිරීම.**

**(අ) ශුන්‍ය අනුප්‍රමාණගත සැපයුම්කරුවන් හැර අනෙකුත් ලියාපදිංචි තැනැත්තන් සඳහා**

**2011.01.01 දිනෙන් ආරම්භ වන කාර්තුව සඳහා** වාර්තා සැපයීම කාර්තුමය පදනමෙන්ද, ගෙවීම් කිරීම මාසික පදනමින්ද සිදු කළ යුතුය.

**(ආ) මූල්‍ය සේවා සැපයුම්කරුවන්**

**2011.01.01 දිනෙන් ආරම්භ වන මාස 06 ක් වන කාල පරිච්ඡේදයෙන් ආරම්භව** බල පැවැත්වෙන පරිදි, අර්ධ වාර්ෂික වාර්තා සැපයීම සහ මාසික පදනමින් ගෙවීම් සිදු කිරීම.

**6. එකතු කළ අගය මත බදු විලම්භන යෝජනා ක්‍රමය**

(අ) දැනට රෙදිපිළි පංගු මණ්ඩලය (TQB) සහ අපනයන සංවර්ධන මණ්ඩලය (EDB) හරහා පාලනය කරනු ලබන එකතු කළ අගය මත බදු විලම්භන යෝජනා ක්‍රමය, නිකුත් කරන ලද අදාල උපදේශන නිකුත් කරමින්, **2011 අප්‍රේල් මස 01 දින සිට බල පැවැත්වෙන පරිදි** දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා යටතේ ක්‍රියාත්මක වනු ඇත.

(ආ) යෝජිත සැපයුම්කරුවන් කාණ්ඩයන්ද දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා යටතේ වන මෙම නව යෝජනා ක්‍රමය යටතට ගැනෙනු ඇත.

7. අනෙකුත් ප්‍රධාන වෙනස්කම්

(අ) තක්සේරු සම්බන්ධයෙන් වූ කාල කඩඉම

හිතාමතා හෝ වාංචනිකව පැහැර හැර ඇති බදු සම්බන්ධයෙන් දැනට පවතින කාල කඩඉම ඉවත් කෙරේ.

(ආ) එකතු කළ අගය මත බදු අත්තිකාරම් බද්ද ගෙවීම (රඳවා ගත් බදු)

එකතු කළ අගය මත බදු පනතේ 26 (අ) වගන්තියේ සඳහන් විධි විධාන තවදුරටත් ක්‍රියාත්මක නොවනු ඇත. ඒ අනුව රජයේ ආයතන මගින් කොන්ත්‍රාත් ගිවිසුමක් යටතේ සිදු කරන ලද ගෙවීම්වලින් එකතු කළ අගය මත බදු රඳවාගැනීමක් නොකළ යුතුය.

(ඇ) දණ්ඩන විධි විධාන

ස්ව තක්සේරු පදනම මත වාරික ගෙවීම් නොකිරීම සහ මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බදු වාර්තා නොඑවීම සම්බන්ධයෙන් දණ්ඩන විධි විධාන පනතට ඇතුලත් කෙරෙනු ඇත.

(ඈ) දින 15 ආපසු ගෙවීම්

යෝජිත නව එකතු කළ අගය මත බදු විලම්භන යෝජනා ක්‍රමය හඳුන්වා දීමත් සමගම, නිශ්චිතව සඳහන් කරන ලද කාණ්ඩයන් සඳහා දින 15 ක් ඇතුලත ආපසු ගෙවීම් සිදු කිරීම සඳහා වූ විධි විධාන, 2011 අප්‍රේල් මස 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉවත් කෙරේ.

**වැඩිදුර පැහැදිලි කර ගැනීම් සඳහා පහත දුරකථන අංකයන්ට අමතන්න.**

| | | |
|---|---|---|
| එකතුකළ අගය මත බදු අංශය | - | දුරකථන : 011-2338541, 011-2338924, 011-2338591 |
| බදු සේවා අංශය | - | දුරකථන : 011-2328702, 011-3009040, 011-3009048 |
| ලේකම් අංශය | - | දුරකථන : 011-2338543, 011-2338635 |
| දේශීය ආදායම් වෙබ් අඩවිය | - | www.inlandrevenue.gov.lk |

## දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්

බදු - වඩා හොඳ අනාගතයකට